සියලු ම හිමිකම් ඇවිරිණි.

# ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය

## අදියර II විභාගය - 2022 ජනවාරි

## (201) උසස් මූල්‍ය ගිණුම්කරණය සහ පිරිවැයකරණය

(Advanced Financial Accounting & Costing)

2022-03-19
පෙරවරු
[8.45 – 12.00]

පිටු ගණන : 10
ප්‍රශ්න ගණන: 07

- **අයදුම්කරුවන්ට උපදෙස්** (අවධානයෙන් කියවිය යුතුය):

(1) ***දී ඇති කාලය :*** *කියවීම සඳහා - විනාඩි 15 යි.*
*උත්තර ලිවීම සඳහා - පැය 03 යි.*

(2) ***සියලුම ප්‍රශ්නවලට උත්තර සැපයිය යුතු වේ.***

(3) *ඉල්ලුම් කරන ලද* ***මාධ්‍යයෙන්, එක් භාෂාවකින් පමණක්,*** *ඔබ වෙත සපයන ලද* ***පොත්වල උත්තර*** *ලියන්න.*

(4) *ගණනය කිරීම් සහ පෙරවැඩ අමුණන්න. උපකල්පන කිසිවක් ඇතොත්, ඒවා පැහැදිලිව දක්වන්න.*

(5) *වැඩසටහන් ගතකිරීම කළ නොහැකි ගණක යන්ත්‍ර* ***පමණක්*** *භාවිත කිරීමට ඉඩ දෙනු ලැබේ.*

(6) *අර්ථකථන සහිත* ***කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුව*** *අමුණා ඇත. වාස්තවික පරීක්ෂණ ප්‍රශ්න හැර අන් සෑම ප්‍රශ්නයක්ම කළ යුතු ක්‍රියාවකින් යුක්ත වේ. කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුවේ එම ක්‍රියාව සඳහා දී ඇති අර්ථකථනය පදනම් කරගෙන අයදුම්කරුවන් විසින් ප්‍රශ්නය සඳහා අවශ්‍ය උත්තර සැපයිය යුතුය.*

(7) *ලකුණු 100 යි.*

---

## A කොටස

### වාස්තවික පරීක්ෂණ ප්‍රශ්න (OTQs)

(මුළු ලකුණු 25)

## 01 වන ප්‍රශ්නය

*අංක **1.1** සිට **1.5** දක්වා ඇති ප්‍රශ්න සඳහා වඩාත්ම නිවැරදි උත්තරය තෝරන්න. තෝරාගත් උත්තරයට අදාළ අංකය ප්‍රශ්න අංකය සමග ඔබේ උත්තර පොතේ ලියන්න.*

**1.1** පහත සඳහන් මූල්‍ය ප්‍රකාශනවල මූලිකාංග අතුරෙන්, සමාගමක මූල්‍ය තත්ත්වය මැනීමට සෘජුවම සම්බන්ධ වන මූලිකාංගය වන්නේ කුමක් ද?

(1) වියදම්. (2) ආදායම්.

(3) වත්කම්. (4) මුදල් ප්‍රවාහ. (ලකුණු 02)

**1.2** 2021 ජනවාරි 01 දින, **සීමාසහිත මැග් සමාගම,** මෝටර් රථයක් රු.3,000,000/- කට විකුණන ලදී. මෙය 2018 අප්‍රේල් 01 දින රු.3,600,000/- කට මිලදීගෙන තිබුණි. මෝටර් රථයේ ඇස්තමේන්තුගත ප්‍රයෝජනවත් ආයු කාලය අවුරුදු 5 ක් වන අතර, මෝටර් රථ පිරිවැය මත සරල මාර්ග ක්‍රමයට ක්ෂය කරනු ලබයි.

ඉහත සඳහන් තොරතුරු අනුව, මෝටර් රථය ඉවත් කිරීමෙන් ලද ලාභය වන්නේ:

(1) රු.1,560,000/-. (2) රු.1,380,000/-. (3) රු.1,000,000/-. (4) රු.800,000/-.

(ලකුණු 02)

**1.3** පහත සඳහන් ප්‍රකාශන සලකා බලන්න:

**(a)** ණයකරහිමියන් සමාගමේ ස්කන්ධ හිමියන් ලෙස සලකනු ලැබේ.

**(b)** ණයකර සඳහා නිශ්චිත ස්ථාවර පොලී අනුපාතයක් තිබේ.

**(c)** ණයකරහිමියන්ට ඡන්දය ප්‍රකාශ කිරීමේ අයිතිය නොමැත.

ඉහත සඳහන් ඒවා අතුරෙන්, ණයකරවලට අදාල නිවැරදි ප්‍රකාශය / ප්‍රකාශනයන් වන්නේ:

(1) **(b)** පමණි. (2) **(a)** සහ **(b)** පමණි.

(3) **(a)** සහ **(c)** පමණි. (4) **(b)** සහ **(c)** පමණි. (ලකුණු 02)

**1.4** පහත සඳහන් ඒවා අතුරෙන්, 1890 හවුල් ව්‍යාපාර ආඥා පනතේ 24 වන වගන්තියට අනුව නිවැරදි වන්නේ කුමක් ද?

(1) හවුල් ව්‍යාපාරයේ ලාභා'ලාභ හවුල්කරුවන් අතර සම සමව බෙදාගත යුතුය.

(2) යෙදවූ ප්‍රාග්ධනය මත පොලියක් ලබා ගැනීමට හවුල්කරුවන්ට හිමිකමක් ඇත.

(3) දැනට සිටින හවුල්කරුවන් බහුතරයකගේ කැමැත්ත සහිතව නව හවුල්කරුවෙකු බඳවාගැනීම කළ හැකිය.

(4) හවුල්කරුවන්ට, ඔවුන් හවුල් ව්‍යාපාරයේ කටයුතු වෙනුවෙන් දරණ ලද වියදම් ප්‍රතිපූර්ණය කර ගැනීමට හිමිකමක් නොමැත. (ලකුණු 02)

**1.5** පහත සඳහන් තොරතුරු මාස 3 ක කාලපරිච්ඡේදයකට අදාලව නිෂ්පාදන සමාගමකින් උපුටාගෙන ඇත:

| | **අයවැයගත** | **සත්‍ය** |
|---|---|---|
| නිෂ්පාදන පොදුකාර්ය (රු.) | 1,200,000 | 1,100,000 |
| යන්ත්‍ර පැය ගණන | 25,000 | 21,500 |

මෙහි නිෂ්පාදන පොදුකාර්ය:

(1) රු.68,000/- කින් අධි අන්තර්ග්‍රහණය වී ඇත. (2) රු.68,000/- කින් ඌන අන්තර්ග්‍රහණය වී ඇත.

(3) රු.168,000/- කින් අධි අන්තර්ග්‍රහණය වී ඇත. (4) රු.168,000/- කින් ඌන අන්තර්ග්‍රහණය වී ඇත. (ලකුණු 02)

*අංක **1.6** සිට **1.10** දක්වා ඇති ප්‍රශ්නවලට උත්තර, ප්‍රශ්න අංක ද සමඟ ඔබේ උත්තර පොතේ ලියන්න.*

**1.6** වත්කමක්, ජංගම වත්කමක් ලෙස වර්ගීකරණය කිරීමට සපුරාලිය යුතු නිර්ණායක දෙකක්(02) සඳහන් කරන්න. (ලකුණු 02)

**1.7** කැලි පදනම් කරගත් ගෙවීම් ක්‍රමයක වාසි තුනක්(03) සඳහන් කරන්න. (ලකුණු 03)

**1.8** **රුවන්** සහ **සමන්** ලාභා'ලාභ සම සමව බෙදා ගනිමින් හවුල් ව්‍යාපාරයක නියැලී සිටී. 2021 මාර්තු 31 දින, හවුල් ව්‍යාපාරයට **වසන්ත** නව හවුල්කරුවෙකු ලෙස සම්බන්ධ වූ අතර, **රුවන්, සමන්** සහ **වසන්ත** අතර නව ලාභා'ලාභ බෙදා ගැනීමේ අනුපාතය පිළිවෙලින් 2 : 1 : 3 වේ.

කැපකළ අනුපාතය (sacrificing ratio) ගණනය කරන්න. (ලකුණු 03)

**1.9** ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 37 (LKAS 37) අනුව, ප්‍රතිපාදනයක් (a provision) සහ අසම්භාව්‍ය වගකීමක් (a contingent liability), අතර වෙනස කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 03)

**1.10** **සීමාසහිත ABC සමාගම,** ප්‍රථම ලැබීම් ප්‍රථම නිකුතු [First In First Out (FIFO)] ක්‍රමය අනුව එහි තොග අගය කරනු ලබයි. තොග සම්බන්ධයෙන් පහත සඳහන් තොරතුරු සමාගමේ වාර්තාවලින් උපුටාගෙන ඇත:

| **දිනය** | **විස්තරය** | **ඒකකයක මිල (රු.)** | **ප්‍රමාණය (ඒකක)** |
|---|---|---|---|
| 2022.01.01 | ශේෂය | 48 | 200 |
| 2022.01.10 | මිලදී ගැනුම් | 50 | 300 |
| 2022.01.18 | විකුණුම් | - | 300 |
| 2022.01.22 | මිලදී ගැනුම් | 49 | 200 |

2022 ජනවාරි 31 දිනට තොගයේ වටිනාකම ගණනය කරන්න. (ලකුණු 04)

(මුළු ලකුණු 25)

*A කොටසෙහි අවසානය*

## <u>B කොටස</u>

(මුළු ලකුණු 50)

## 02 වන ප්‍රශ්නය

**තරුට** අයිති කේවලස්වාමි ව්‍යාපාරයක් වන **තරු ට්‍රේඩර්ස්** හි පොත්වලින් පහත සඳහන් තොරතුරු උපුටාගෙන ඇත:

(1) 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා **තරු ට්‍රේඩර්ස්** හි මුදල් පාලන ගිණුම (මුදල් පොත) පහත පරිදි වේ:

| | **හර (රු.)** | | **බැර (රු.)** |
|---|---|---|---|
| 2021 ජනවාරි 01 දිනට ඉ/ගෙ ශේෂය | 100,000 | 2021 ජනවාරි 01 දින අත්පත් කරගත් කාර්යාල උපකරණ | 75,000 |
| වෙළෙඳ ලැබිය යුතු මුදල්වලින් ලැබීම් | 2,683,540 | වෙළෙඳ ගෙවියයුතු මුදල් සඳහා ගෙවීම් | 1,744,301 |
| | | කුලිය | 180,000 |
| | | වැටුප් සහ වේතන | 360,000 |
| | | විදුලිය | 27,000 |
| | | **තරු** විසින් සිදු කළ ගැනිලි | 385,000 |
| | | බැංකු ගාස්තු | 6,900 |
| | | 2021 දෙසැම්බර් 31 දිනට ප/ගෙ ශේෂය | 5,339 |
| | **2,783,540** | | **2,783,540** |

(2) 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය තුළදී රු.125,000/- කට ණය පදනම මත ගනුදෙනුකරුවෙකු මිලට ගත් භාණ්ඩ, ඒවායෙහි වර්ණය වෙනස්වීම නිසා ඔහු විසින් ආපසු හරවා එවා ඇත. **තරු** විසින් මෙම ආපසු එවීම පිළිගෙන ඇත. කෙසේනමුත් මේ සඳහා ගිණුම් පොත්වල ගැළපීම් සිදුකොට නැත.

(3) 2021 දෙසැම්බර් 31 සහ 2020 දෙසැම්බර් 31 යන දිනයන්වලට වත්කම් සහ වගකීම් පහත පරිදි විය:

*(රු.)*

| | 2021 දෙසැම්බර් 31 දිනට | 2020 දෙසැම්බර් 31 දිනට |
|---|---|---|
| කාර්යාල උපකරණ ධාරණ අගයට | 725,000 | 700,000 |
| තොග පිරිවැයට | 341,050 | 327,250 |
| වෙළෙඳ ලැබිය යුතු මුදල් | 452,800 | 250,725 |
| බැංකුවේ ඇති මුදල් | 5,339 | 100,000 |
| වෙළෙඳ ගෙවිය යුතු මුදල් | 320,458 | 150,475 |
| උපචිත විදුලිය | 7,000 | 16,000 |

**ඔබ විසින් කළ යුතු දෑ:**

2021 දෙසැම්බර් 31 දිනට **තරු ට්‍රේඩර්ස්** හි ශේෂ පිරික්සුම **පිළියෙල කරන්න.** (ලකුණු 10)

## 03 වන ප්‍රශ්නය

**රජිත්, මලිත්** සහ **උදිත්,** ලාභා'ලාභ පිළිවෙලින් 1:2:2 අනුපාතයට බෙදා ගනිමින් **RMU හවුල්කරුවෝ** නමින් හවුල් ව්‍යාපාරයක් පවත්වාගෙන ගියහ.

(1) හවුල් ගිවිසුමේ පහත සඳහන් දෑ ඇතුළත් විය:

- **මලිත්** මාසිකව රු.35,000/- ක වැටුපක් ලැබීමට හිමිකම් ලබයි.
- ආරම්භක ප්‍රාග්ධන ගිණුම් ශේෂයන් මත, වාර්ෂිකව 6% බැගින් ප්‍රාග්ධනය මත පොලී ගෙවනු ලබයි.

(2) 2021 ජනවාරි 01 දිනට හවුල්කරුවන්ගේ ප්‍රාග්ධන සහ ජංගම ගිණුම් ශේෂ පහත පරිදි වේ:

*(රු.'000)*

| | හර | බැර |
|---|---|---|
| ප්‍රාග්ධන ගිණුම්: | | |
| **රජිත්** | | 3,000 |
| **මලිත්** | | 6,000 |
| **උදිත්** | | 6,000 |
| ජංගම ගිණුම්: | | |
| **රජිත්** | | 125 |
| **මලිත්** | 560 | |
| **උදිත්** | | 25 |

(3) 2021 දෙසැම්බර් 31 දින, **මලිත්** හවුල් ව්‍යාපාරයෙන් විශ්‍රාම ගැනීමට තිරණය කරන ලද අතර, **රජිත්** සහ **උදිත්** ලාභා'ලාභ සමසමව බෙදාගනිමින් හවුල් ව්‍යාපාරය එම නම යටතේම පවත්වා ගැනීමට තිරණය කළහ.

(4) **මලිත්ගේ** වැටුප අය කිරීමෙන් පසු, 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා හවුල් ව්‍යාපාරයේ ශුද්ධ ලාභය රු.7,000,000/- කි.

(5) 2021 දෙසැම්බර් 31 දින, හවුල් ව්‍යාපාරයේ කීර්තිනාමය රු.1,750,000/- කට අගය කරන ලද අතර, එය කීර්තිනාම ගිණුමක් විවෘත කිරීමකින් තොරව හවුල්කරුවන්ගේ ප්‍රාග්ධන ගිණුම් හරහා ගැලපීමට එකඟ වන ලදී.

(6) **RMU හවුල්කරුවෝ** හි ජංගම නොවන වත්කම් 2021 දෙසැම්බර් 31 දින පහත සඳහන් පරිදි ප්‍රත්‍යාගණනය කරන ලදි:

*(රු.'000)*

| | **පිරිවැය** | **2021 දෙසැම්බර් 31 දිනට සමුච්චිත ක්ෂය** | **2021 දෙසැම්බර් 31 දිනට ප්‍රත්‍යාගණිත අගය** |
|---|---|---|---|
| ඉඩම සහ ගොඩනැගිල්ල | 8,000 | 1,500 | 8,000 |
| මෝටර් වාහන | 5,000 | 3,000 | 7,500 |

ජංගම නොවන වත්කම්, හවුල්කරුවන්ගේ ගිණුම් පොත්වල ප්‍රත්‍යාගණිත අගයට පවත්වාගෙන යාමට එකඟ විය.

(7) **මලිත්** විශ්‍රාම ගන්නා විට ඔහුට ගෙවිය යුතු මුදල, ණය ගිණුමකට මාරු කිරීමට තීරණය විය.

**ඔබ විසින් කළ යුතු දෑ:**

2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා **RMU හවුල්කරුවෝ** හි පහත සඳහන් දෑ **පිළියෙළ කරන්න**:

(a) හවුල්කරුවන්ගේ ප්‍රාග්ධන ගිණුම්. (ලකුණු 06)

(b) හවුල්කරුවන්ගේ ජංගම ගිණුම්. (ලකුණු 04)

(මුළු ලකුණු 10)

## **04** වන ප්‍රශ්නය

**හැපි ක්‍රීඩා සමාජය,** එහි සාමාජිකයන්ට ක්‍රීඩා කටයුතු සඳහා පහසුකම් සපයනු ලබන අතරතුර එහි සාමාජිකයන් සඳහා ආපනශාලාවක් ද පවත්වාගෙන යනු ලබන ක්‍රීඩා සමාජයකි. පහත සඳහන් තොරතුරු **හැපි ක්‍රීඩා සමාජයේ** පොත්වලින් උපුටාගෙන ඇත:

(1) 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා **හැපි ක්‍රීඩා සමාජයෙහි** ලැබීම් සහ ගෙවීම් පහත සඳහන් පරිදි විය:

| **ලැබීම්** | **රු.** |
|---|---|
| ආපනශාලාවේ විකුණුම් | 1,575,000 |
| සාමාජික ගාස්තු | 2,250,000 |
| ක්‍රීඩා පිටිය කුලියට දීමෙන් ලද ආදායම | 557,000 |
| | |
| | |
| | **4,382,000** |

| **ගෙවීම්** | **රු.** |
|---|---|
| වැටුප් සහ වේතන | 1,500,000 |
| ආපනශාලාව සඳහා මිලදී ගැනුම් | 682,500 |
| ගොඩනැගිල්ල මත කුලිය | 350,000 |
| විදුලිය සහ ජලය | 291,000 |
| ක්‍රීඩාපිටි නඩත්තුව | 228,000 |
| | **3,051,500** |

(2) ක්‍රීඩා සමාජයේ අනෙකුත් වත්කම් පහත පරිදි වේ: *(රු.)*

| | **2021 දෙසැම්බර් 31 දිනට** | **2021 ජනවාරි 01 දිනට** |
|---|---|---|
| තොගය - ආපනශාලාව | 33,500 | 52,000 |
| ක්‍රීඩා උපකරණ - ධාරණ අගයට | 1,300,000 | 1,550,000 |
| ආපනශාලාවේ ඇති ලී බඩු - ධාරණ අගයට | 300,000 | 325,000 |

(3) 2021 ජනවාරි 01 දිනට ලැබිය යුතු සාමාජික මුදල් හෝ කලින් ලද සාමාජික මුදල් කිසිවක් නොතිබුණි. ක්‍රීඩා සමාජයේ මුළු සාමාජිකයන් ගණන වන සාමාජිකයන් 372 දෙනා අතුරින් 300 දෙනෙකු පමණක් 2021 වර්ෂය සඳහා සාමාජික මුදල් ගෙවා ඇත. එක් සාමාජිකයෙකුගේ වාර්ෂික සාමාජික මුදල රු.7,500/- කි.

(4) පහත සඳහන් වියදම් ආපනශාලාව වෙත පහත පරිදි බෙදාහැරිය යුතුය:

| | |
|---|---|
| වැටුප් සහ වේතන | 30% |
| විදුලිය සහ ජලය | 40% |
| ගොඩනැගිල්ල මත කුලිය | 25% |

(5) වර්ෂය තුළ දේපළ, පිරියත සහ උපකරණවල කිසිදු අත්පත් කරගැනීමක් හෝ ඉවත් කිරීමක් සිදුවී නොමැත.

**ඔබ විසින් කළ යුතු දෑ:**

2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා **හැපි ක්‍රීඩා සමාජයෙහි** පහත සඳහන් දෑ **පිළියෙල කරන්න:**

(a) ආපනශාලා ආදායම් ප්‍රකාශය. (ලකුණු 04)

(b) ආදායම් සහ වියදම් ගිණුම. (ලකුණු 06)

(මුළු ලකුණු 10)

## 05 වන ප්‍රශ්නය

(A) **සීමාසහිත වින් (පෞද්ගලික) සමාගමේ** සේවකයන්, වැඩකරන ලද පැය ගණන මත සිය මූලික වේතන ලබයි. මෙයට අමතරව, නිෂ්පාදනය කරන ලද ඒකක ගණන මත පදනම්ව ඉතිරිකරන ලද කාලය සඳහා ප්‍රසාද දීමනාවක් ගෙවනු ලබයි.

සේවකයෙකුට අදාලව පහත සඳහන් තොරතුරු සපයා ඇත:

| | |
|---|---|
| සතියක සාමාන්‍ය වැඩකරන පැය ගණන | දවසකට පැය 8 ක් සහ සතියකට වැඩකරන දවස් 5 ක් |
| පැයක මූලික වේතන අනුපාතය | රු.275/- |
| ඒකකයක් සඳහා ඉඩදෙන සම්මත කාලය | මිනිත්තු 12 |
| ප්‍රසාද දීමනාව | ඉතිරි කළ කාලයෙන් 120% ක් මූලික වේතන අනුපාතයට |
| සේවකයා විසින් පසුගිය සතියේදී නිෂ්පාදනය කරන ලද ඒකක ප්‍රමාණය | ඒකක 265 |

ඉහත සඳහන් තොරතුරු මත පදනම්ව,

**ඔබ විසින් කළ යුතු දෑ:**

පසුගිය සතිය සඳහා සේවකයාගේ මුළු ඉපැයීම **ගණනය කරන්න**. (ලකුණු 05)

(B) **සීමාසහිත ෆ්ලෙක්ස් (පෞද්ගලික) සමාගමේ, X නිෂ්පාදිතයට** අදාලව පහත සඳහන් තොරතුරු ඔබට ලබාදී ඇත:

| | |
|---|---|
| වාර්ෂික ඉල්ලුම | ඒකක 4,000 |
| ඒකකයක ගැනුම් මිල | රු.12,500/- |
| ඇණවුම් කිරීමේ පිරිවැය | ඇණවුමකට රු.450,000/- |
| පොරොත්තු කාලය | මාස 3 - 4 |
| ඒකකයක වාර්ෂික රඳවා ගැනීමේ පිරිවැය | ගැනුම් මිලෙන් 20% |
| භාවිතය | ඒකක 150 - 400 |

**ඔබ විසින් කළ යුතු දෑ:**

පහත සඳහන් දෑ **ගණනය කරන්න**:

(a) ආර්ථික ඇණවුම් ප්‍රමාණය [Economic Order Quantity (EOQ)]. (ලකුණු 03)

(b) යළි ඇණවුම් මට්ටම (Re-order Level). (ලකුණු 02)

(මුළු ලකුණු 10)

## 06 වන ප්‍රශ්නය

(A) **සීමාසහිත B (පෞද්ගලික) සමාගමට,** නිෂ්පාදන දෙපාර්තමේන්තු 2 ක් සහ සේවා දෙපාර්තමේන්තුවක් තිබේ.

(1) සමාගම විසින් 2022 අප්‍රේල් මාසය සඳහා පහත සඳහන් නිෂ්පාදන පොදුකාර්ය පිරිවැය ඇස්තමේන්තුගත කරන ලදී:

| **පිරිවැය අයිතමය** | **පිරිවැය (රු.)** |
|---|---|
| යන්ත්‍ර මත ක්ෂය | 24,000 |
| කර්මාන්තශාලා කුලිය | 350,000 |
| සුපරික්ෂණ පිරිවැය | 120,000 |
| විදුලිය | 150,000 |
| **එකතුව** | **644,000** |

(2) පොදුකාර්ය පිරිවැය විභජනය කිරීමේ පදනම් පහතින් දී ඇත:

| **විස්තරය** | **පදනම** | **නිෂ්පාදන** | | **සේවා** | **එකතුව** |
|---|---|---|---|---|---|
| | | **නිෂ්පාදන** | **ඇසුරුම් කිරීම** | **නඩත්තු** | |
| භාවිත කරන ලද බිම් ප්‍රමාණය | වර්ග අඩි | 1,400 | 3,350 | 250 | 5,000 |
| සේවකයින් | සේවකයන් ගණන | 40 | 100 | 20 | 160 |
| යන්ත්‍රවල වටිනාකම | රු. | 620,000 | 930,000 | 50,000 | 1,600,000 |
| විදුලිය | කිලෝ වොට් | 1,000 | 300 | 200 | 1,500 |
| පිරිවැය විභජනය - නඩත්තු | | 60% | 40% | | |

**ඔබ විසින් කළ යුතු දෑ:**

එක් එක් නිෂ්පාදන දෙපාර්තමේන්තුව සඳහා පොදුකාර්ය පිරිවැය වෙන්කර විභජනය කරනු ලබන්නේ කෙසේදැයි දැක්වෙන ප්‍රකාශයක් **පිළියෙළ කරන්න**. (ලකුණු 06)

(B) **සීමාසහිත Z සමාගමේ, කාර්යය අංක 100** ට අදාළව පහත සඳහන් තොරතුරු උපුටාගෙන ඇත:

| | |
|---|---|
| සෘජු අමුද්‍රව්‍ය | කිලෝග්‍රෑම් එකක් රු.120/- බැගින් කිලෝග්‍රෑම් 1,800 |
| සෘජු ශ්‍රමය | පැයකට රු.800/- බැගින් පැය 300 |
| නිෂ්පාදන පොදුකාර්ය | සෘජු ශ්‍රම පිරිවැයෙන් 80% |

සමාගම, පිරිවැය මත 15% ක ලාභයක් තබා ගනී.

**ඔබ විසින් කළ යුතු දෑ:**

**කාර්යය අංක 100** සඳහා අයකළ යුතු මිල **ගණනය කරන්න.** (ලකුණු 04)

(මුළු ලකුණු 10)

*B කොටසෙහි අවසානය*

# C කොටස

(මුළු ලකුණු 25)

## 07 වන ප්‍රශ්නය

2021 මාර්තු 31 දිනට, **සීමාසහිත ගෝ ලංකා (පෞද්ගලික) සමාගමේ** ශේෂ පිරික්සුම පහත පරිදි වේ:

*(රු.'000)*

| | **හර** | **බැර** |
|---|---|---|
| ප්‍රකාශිත ප්‍රාග්ධනය (සාමාන්‍ය කොටස් 5,000,000) | | 250,000 |
| 2020 අප්‍රේල් 01 දිනට, රඳවාගත් ඉපැයීම් | | 108,000 |
| 12% ණයකර | | 15,000 |
| මෝටර් වාහන | 75,000 | |
| කාර්යාල උපකරණ | 53,000 | |
| **2020 අප්‍රේල් 01 දිනට සමුච්චිත ක්ෂය:** | | |
| මෝටර් වාහන | | 19,000 |
| කාර්යාල උපකරණ | | 27,500 |
| වෙළෙඳ ලැබිය යුතු මුදල් | 357,500 | |
| වෙළෙඳ ගෙවිය යුතු මුදල් | | 287,425 |
| 2021 මාර්තු 31 දිනට, තොගය | 189,841 | |
| බැංකුවේ ඇති මුදල් | 144,319 | |
| විකුණුම් | | 850,000 |
| විකුණුම් පිරිවැය | 603,500 | |
| අලෙවි කණ්ඩායම සඳහා දිරි දීමනා | 8,500 | |
| කාර්යාල කුලිය | 1,125 | |
| ප්‍රචාරණය | 25,500 | |
| ජලය සහ විදුලිය | 1,225 | |
| බැංකු ගාස්තු | 560 | |
| ණයකර පොලිය | 900 | |
| වැටුප්, සේවක අර්ථසාධක අරමුදල (EPF) සහ සේවා නියුක්තයන්ගේ භාර අරමුදල (ETF) | 95,744 | |
| අනෙකුත් පරිපාලන වියදම් | 27 | |
| 2019/20 වර්ෂය සඳහා ආදායම් බදු වෙන් කිරීම | | 55 |
| ගෙවූ ආදායම් බදු | 3,055 | |
| 2020 අප්‍රේල් 01 දිනට වෙළෙඳ ලැබිය යුතු මුදල් සඳහා ප්‍රතිපාදනය | | 2,750 |
| ගෙවිය යුතු සේවක අර්ථසාධක අරමුදල් (EPF) සහ සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් (ETF) | | 66 |
| | **1,559,796** | **1,559,796** |

පහත සඳහන් අතිරේක තොරතුරු ද සපයා ඇත:

(1) පිරියත සහ උපකරණ, සරල මාර්ග ක්‍රමයට පිරිවැය මත ක්ෂය කරනු ලබන අතර, පිරියත සහ උපකරණවල ප්‍රයෝජනවත් ආයු කාලය පහත සඳහන් පරිදි වේ:

| | |
|---|---|
| මෝටර් වාහන | වර්ෂ 4 |
| කාර්යාල උපකරණ | වර්ෂ 5 |

(2) 2021 මාර්තු 20 දින, රු.250,000/- ක් පිරිවැය වූ තොග කාණ්ඩයක් ගංවතුරෙන් විනාශ වූ අතර එම තොගය ගිණුම් පොත්වලින් ලියා හැරීමට තීරණය කරන ලදි. හානිය සඳහා රක්ෂණ වන්දිය වශයෙන් රු.160,000/- ක් රක්ෂණ සමාගම විසින් අනුමත කරන ලද අතර, 2021 මාර්තු 31 දිනට එය ලැබිය යුතුව තිබුණි. මේ සම්බන්ධයෙන් ගිණුම් පොත්වල කිසිදු ගැලපීමක් සිදුකර නොතිබුණි.

(3) කොවිඩ්-19 හේතුවෙන් ඇතිවූ ව්‍යාපාරික ඇණහිටීම් සැළකිල්ලට ගනිමින්, 2021 මාර්තු 31 දිනට වෙළෙඳ ලැබිය යුතු මුදල් සඳහා වන ප්‍රතිපාදනය තවත් රු.560,000/- කින් ඉහළ නැංවීමට අධ්‍යක්ෂ මණ්ඩලය තීරණය කර ඇත.

(4) මාසික කාර්යාල බදු කුලිය රු.75,000/- ක් වේ. 2021 මාර්තු 31 දිනට, සමාගම විසින් මාස 3 ක බදු කුලී කලින් ගෙවා ඇත.

(5) 2019/20 තක්සේරු වර්ෂය සඳහා වූ රු.55,000/- ක ආදායම් බද්ද සහ 2020/21 තක්සේරු වර්ෂය සඳහා වන රු.3,000,000/- ක ආදායම් බද්ද යන දෙකෙහිම එකතුව වූ රු.3,055,000/- ක් වර්ෂය තුළදී ගෙවා තිබේ. 2020/21 තක්සේරු වර්ෂය සඳහා වන ආදායම් බද්ද රු.3,825,000/- ක් ලෙස ඇස්තමේන්තු කර ඇත.

(6) 2020 අප්‍රේල් 01 දින, සමාගම විසින් එකක් රු.100/- බැගින් වූ 12% ණයකර නිකුත් කර ඇත. පොලිය අර්ධ වාර්ෂිකව (bi-annually) ගෙවිය යුතු වේ.

(7) මූල්‍ය ප්‍රකාශන නිකුත් කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2021 මැයි 31 දින අනුමැතිය ලබාදෙන ලදි.

**ඔබ විසින් කළ යුතු දෑ:**

**සීමාසහිත ගෝ ලංකා (පෞද්ගලික) සමාගමේ,** කළමනාකාරිත්වයේ භාවිතය සඳහා, පහත සඳහන් දෑ **පිළියෙල කරන්න**:

(a) 2021 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ලාභ'ලාභ සහ වෙනත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය (විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය). (ලකුණු 13)

(b) 2021 මාර්තු 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය. (ලකුණු 12)

(මුළු ලකුණු 25)

*C කොටසෙහි අවසානය*

# <u>කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුව</u>

| නිපුණතා මට්ටම | විස්තරය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචනය |
|---|---|---|---|
| **දැනුම (1)** | තොරතුරු සහ මූලික සංකල්ප ආවර්ජනය කිරීම | **අඳින්න** | හැඩයක් හෝ රූපසටහනක් ගෙන හැර දැක්වීම. |
| | | **සම්බන්ධ කරන්න** | තාර්කික හෝ හේතු කාරක සම්බන්ධතාව තහවුරු කිරීම. |
| | | **සඳහන් කරන්න** | ස්ථිර ලෙස හෝ පැහැදිලිව ප්‍රකාශ කිරීම. |
| | | **හඳුනා දක්වන්න** | සැලකිලිමත්වීමෙන් පසුව හඳුනා ගැනීම, තහවුරු කිරීම හෝ තෝරා ගැනීම. |
| | | **ලැයිස්තුගත කරන්න** | විස්තර කිරීමකින් තොරව සම්බන්ධිත අයිතම ලිවීම. |

| නිපුණතා මට්ටම | විස්තරය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචනය |
|---|---|---|---|
| **අවබෝධය (2)** | අදහස් හා තොරතුරු පැහැදිලි කිරීම. | **හඳුනාගන්න** | අන්දැකීම් හෝ දැනුම භාවිතයෙන් වලංගුබව හෝ වෙනත් ආකාරයෙන් පෙන්වීම. |
| | | **අර්ථකතනය කරන්න** | වටහාගත හැකි හෝ හුරුපුරුදු පදවලට පරිවර්තනය කරන්න. |
| | | **විස්තර කරන්න** | ප්‍රධාන ලක්ෂණ ලියා සන්නිවේදනය කරන්න. |
| | | **පැහැදිලි කරන්න** | අදාළ කරුණු භාවිත කර පැහැදිලි විස්තරයක් කිරීම. |
| | | **නිර්වචනය කරන්න** | ස්වභාවය, විෂය පථය හෝ තේරුම නිශ්චිතව ප්‍රකාශ කිරීම. |

| නිපුණතා මට්ටම | විස්තරය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචනය |
|---|---|---|---|
| **භාවිතය (3)** | අළුත් තත්ත්වයන් තුළ දැනුම භාවිත කර ගැළපීම. | **සසඳන්න** | තවත් එකක් සමග අනුගත / අනුරූප කරන්න. |
| | | **ප්‍රස්තාර දක්වන්න** | ප්‍රස්තාර මගින් නියෝජනය කරන්න. |
| | | **තක්සේරු කරන්න** | වටිනාකම, ස්වභාවය, හැකියාව හෝ ගුණාත්මක බව තීරණය කරන්න. |
| | | **විසඳන්න** | ගණනය කිරීම හා / හෝ පැහැදිලි කිරීම් හරහා විසඳුම් සෙවීම. |
| | | **පිළියෙල කරන්න** | විශේෂ අරමුණ සඳහා යමක් කිරීම හෝ සූදානම් වීම. |
| | | **ප්‍රදර්ශනය කරන්න** | උදාහරණ සමග ඔප්පු කිරීම හෝ ප්‍රදර්ශනය කිරීම. |
| | | **ගණනය කරන්න** | ගණිතමය ගණනය කිරීම මගින් සොයා ඇතගැනීම හෝ ගණන් ගැනීම. |
| | | **භාවිත කරන්න** | ප්‍රයෝගිකව භාවිතයේ යෙදෙන්න. |

| නිපුණතා මට්ටම | විස්තරය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචනය |
|---|---|---|---|
| **විශ්ලේෂණය (4)** | අදහස් අතර සම්බන්ධතා ගොඩනගා ප්‍රශ්න විසඳීම. | **සන්නිවේදනය කරන්න** | තොරතුරු බෙදාහදා ගැනීම හෝ හුවමාරු කර ගැනීම. |
| | | **සැකිල්ලක් සේ දක්වන්න** | සුවිශේෂී ලක්ෂණ සාරාංශ කොට දැක්වීම. |
| | | **අසමානතා බලන්න** | අසමානතා හෝ වෙනස්කම් සෙවීම පිණිස පරීක්ෂා කිරීම. |
| | | **සමානකම් බලන්න** | සමානකම් සොයාගැනීම පිණිස පරීක්ෂා කිරීම. |
| | | **විමසන්න** | තර්ක මගින් සවිස්තර ලෙස පරීක්ෂා කිරීම. |
| | | **වෙනස්කොට දක්වන්න** | යමක් තවෙකෙකින් වෙනස්කොට දක්වන දැ හඳුනා ගැනීම. |
| | | **විශ්ලේෂණය කරන්න** | විසඳුම් හෝ ප්‍රතිඵලය තීරණය කිරීම පිණිස විස්තරාත්මකව පරීක්ෂා කරන්න. |